Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂයය:- තොරතුරු තාක්ෂණය

සතිය - පෙබ 3

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## පැස්කල් ක්‍රමලේඛන භාෂාව

01. ක්‍රමලේඛ භාෂාවක් තුල අරාවන් භාවිතා කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

02. අරාවක ලක්ෂණ නම් කරන්න.

03. පැස්කල් භාෂාවේදී ඒකමාන අරාවක් අර්ථ දක්වන ආකාරය ලියන්න.

04. පූර්ණ සංඛ්‍යාත්මක අගයන් 5ක් ඇතුලත් කලහැකි Digit නම් වූ අරාව පැස්කල් කේත ඛණ්ඩයක් ලෙස ලියන්න.

05. ඔබ විසින් අර්ථදක්වන ලද Digit නැමැති අරාවට පහත සඳහන් සංඛ්‍යාත්මක අගයන් අනුපිළිවෙලින් පැවරීම සඳහා අදාල පැස්කල් ක්‍රමලේඛ ඛණ්ඩය ලියන්න.

06. පහත සඳහන් සංසිද්ධි සඳහා අරාවන් භාවිතා කර පැස්කල් ක්‍රමලේඛ ලියන්න.

- සිසුන් 20 දෙනෙකුගේ තොරතුරු තාක්ෂණ ලකුණු IT නැමැති අරාවට ඇතුලත් කිරීම.
- ඔබ නිවසේ සාමාජිකයන්ගේ වයස (අවුරුදු) A නැමැති අරාවට ඇතුලත් කිරීම.

07. නිර්මාණය කරනලද අරාවක අගයන් ප්‍රකාශයට පත් කිරීම සිදු කල හැක. ඔබ විසින් ඉහත ප්‍රශ්ණයේදී නිර්මාණය කරන ලද IT සහ A නැමති අරාවන් දෙක සඳහා පහත විස්තර ලබාගැනීමට අදාල පැස්කල් ක්‍රමලේඛ ඛණ්ඩයන් ලියන්න.

- IT නැමැති අරාවේ පස්වන සිසුවාගේ සිට පහලොස්වන සිසුවා දක්වා ඔවුන්ට අදාල ලකුණු ප්‍රකාශයට පත් කිරීම.
- IT නැමැති අරාවේ 6, 12, 17 යන අවයව වල අගයන් ප්‍රකාශයට පත් කිරීම.
- A නැමැති අරාවේ පලමු සාමාජිකයාගේ සහ අවසාන සාමාජිකයාගේ වයස වෙන වෙනම ප්‍රකාශයට පත් කිරීම.